පොඩිත්තන්ට උපදේශ කවි කතා.

අයි. ඒ. ක්‍රිලෝව්



චිත්‍ර: ජී. කුප්‍රියානොෆ්

අනුවාදය: රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

අයි. ඒ. ක්‍රිලෝව්

පොඩිත්තන්ට උපදේශ කවි කතා

චිත්‍ර : ජී. කුප්රියානොෆ්

අනුවාදය : රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

පොඩිත්තන්ට උපදේශ කවි කතා

© රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

ISBN 955-1319-00-X

කර්තෘ : අයි. ඒ. ක්‍රිලෝවා

චිත්‍ර : ජී. කුප්රියානොෆ්

මුද්‍රණය : කැනොල් ප්‍රින්ට්

ප්‍රකාශනය : **සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම**
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

බත් කූරා හා කුහුඹු පැංචා



අත්තෙන් අත්තට පැන-පැන
ඉගිලි ඉගිලි ගී ගය-ගය
ඉර පායා තිබු කාලෙදි
බත් කූරා හිටියා

බලන්නටත් පෙර වටපිට
හීත කාලෙ එයි හනිකට
ගහ කොළ මළ සිරි ගත්තේ
හිරු දෙවියෝ හැංගුණා

සීත හිම සමය එන විට
අගහිඟකම් කුසගින්න ද
මෝරා එන්නට වන්නේ
දැන් කූරා නොගයන්නේ

ගී ගැයුවට බඩ පිරෙයි ද?
කාට මේක නොතේරෙයි ද?
කාන්සියෙන් මැලවෙන්නේ
කුහුඹිය වෙත ඌ යන්නේ

බත් කූරා: "මා ආදර ටිකිරි මලේ
මා හැරදා නොයන් මලේ
එළඹෙන තුරු රස්නෙ කලේ
කෑම බීම දියන් බොලේ"

කුහුඹු පැංචා: "මෙය මට මහ පුදුමයකී
වැඩ කළා ද නුඹ වෙර දී?
සිහිපත් කරනුව පැහැදී
රස්නෙ කාලෙ ගැයු හැටි ගී"

බත් කූරා: "අපේ රැහේ වැඩක් නැතේ
කෙළි සෙල්ලම් බොහොම ඇතේ
ඒවායින් හිස කැරකේ
හැම වෙලේම ගී ගැයෙතේ"

කුහුඹු පැංචා: "කෑම නොසොය නුඹ රස්නෙ කාලෙ නිති
කිසි මිහිරක් නැති ගී ගැයුවා නම්
අනුන්ට එල නැති තමන්ට වැඩ නැති
කෙළි සෙල්ලම් පාමින් සිටියා නම්
සීත කාලෙදිත් එලෙසම හිටපන්
අත පා අනුනට දණින් නොවැටියන්
මට පව් නොදියන් විගහට පලයන්
තව තත්පරයක් මෙතැන නොරැඳියන්"

බූරුවා සහ කොවුලා

කෝකිලයා දුටු බූරු නයිදෙ අපෙ
පැනයක් විසඳා ගන්න හදනවා
"හැබෑ ද මිතුරෝ සැවොම කියන්නේ
ගායකයෙකු යැයි නිපුන?" අහනවා

"අනේ මටත් උඹෙ ගී හඬ අහලම
ඇත්තමදැයි දන ගන්න තිබුණ නම්
උඹේ හපන්කම් ගැන මට තනියෙම
සහතිකයක් වුව දෙන්නට පිළිවන්"

එබස ඇසූ කෝකිලා
තම හැකියා පෙන්වලා
උගුර කටත් පාදලා
ගී ගැයුමක් අරඹලා

උස් හඬ දෙන්නේ
පහළට ගන්නේ
දිගට අදින්නේ
ගලාන යන්නේ

සිවුරු නඳ නඟනවා
අයෙමත් අදිනවා
ලතාවට ගයනවා
නිමාව ද කරනවා

ගැයුම පැතිරුණු ඈත පෙදෙසින්
නලාවක වන් හඬක් නැගුණා
වන ලැහැබ සිරි-සිරි හඬින් ඒ
ගායනාවට තාල දුන්නා

නැගෙන හිරුගේ කිරණ වන් මේ
සදාදර ගායක තෙමේ වෙත
තුති පිදුමකට වගේ නැවතුනි
කුරුළු කිචි-බිචි චණ්ඩ මාරුත

එළු, බැටළු, ගව රංචු ගැල ගති
එඬේරාට ද හුස්ම නොවැටිණි
කොවුල් ගීයෙන් ඔවුන් මත් වී
උන් හිටිය තැන් සිතින් ගිලිහිණි

නිමා වූ පසු ගැයුම කොවුලගෙ
යොමා නළලත මහ පොළොව වෙත
ගැසී හරි බරි බූරු නයිදේ
ඇගයුමක් කෙරුවේ ය මේ ලෙස

"ඉතා හොඳ බව ගැයුම නුඹගේ
පැවසීම බොරුවක් නො වේ ම ය
නුඹේ ගැයුමට සවන් දීගෙන
සිටිය හැක කිසි පාලුවක් නැත

ඒත් කනගාටුවට කරුණකි
නාඳුනයි නුඹ කුකුල් හාමිව
උගේ කටහඬ කනට වැටුණොත්
ඉගෙන ගන්නට සිතේවී තව"

ගැයුම ගැන කළ විමසුමෙන් පසු
අපේ අසරණ කොවුල් රාළට
යන්ට සිත්විය ඈත පිටිසර
මෙවන් අය නැති හුදෙකලාවට

§§

දෙවියෝ බලන්නේ
මෙවන් විනිසුරුවන්නේ
මේ ලොව මුදන්නේ
එවිට සැනසුම සැපත වන්නේ

කණ්නාඩියයි වඳුරු මොටයි

කොහෙද තිබූ කණ්නාඩියක්
අහුලා ගත් වඳුරු මොටෙක්
දැකලා එහි තමන්ගෙ රුව
කකුලෙන් පෑගුව වළහව

"වලස් හාමි මේ බලපන්
මේ කැත රුව කාගෙ කියන්!
ඇදවුණු කට උගෙ අරුමයි
පිනුම් උගේ හරි පුදුමයි

යන්තම්වත් මුගේ රුවට
සමාන වී නම් මා රුව
හෙම්බත් වී දුකින් බරව
මිය යන්නට තිබුණා මාව

මගේ යෙහෙළියන් අතරින්
මේ වගෙ කැත මුහුණුත් ඇති
පස්-හය දෙනෙකු ම ඉන්නව
ගැනල වුණාත් මට කිවහැකි"

"නුඹේ යෙහෙළියන් ගණින්න
මහන්සි වෙන්නේ කුමකට
තමන්ගේ ම හැඩ රුව ගැන
බලාගත්තොතින් නරක ද?"

වලස් හාමි දුන් පිළිතුර
වඳුරගෙ සතුටට නොවී ය
ඒ උපදෙස් ගඟට කැපුව
ඉනි මෙන් වැඩකට නොවී ය.

මේ වාගේ උදාහරණ
ලොව තුළ තව බොහො ඇත්තෙ ය
තම ඇද-කුද දැන ගැනුමට
කිසිවෙක් නොකරති ලෝලය

අල්ලස් ගන්නේ පීතර
බව රහසක් නොවේ සැමට
ඒ ගැන දොස් කියනා විට
නෑසුණු සේ බලයි ඉවත

ඒ මදිවට සැලසුම් කර
අවලාදත් නගයි නිතර
අල්ලස් ගන්නේ ඔහු නොව
සිඟද්ඝෙදෝ බව කියයි සැමට

කුකුල් හාමියි ඇටි කුකුළයි

ඇටි කුකුළා:

"මගේ ආදර කුකුල් හාමි
ගැයුම නුඹේ
හරි සද්දයි
හරි වැදගත් !"

කුකුල් හාමි:

"ඇටි කුකුලෝ මගෙ හිත ගත්
ගැයුම නුඹේ
ගලා යනව
ඇදී යනව
මේ මුළු කැලයෙ ම නුඹ වැනි
ගායකයෙක් වෙන කොයින් ද?"

ඇටි කුකුළා:

"කුකුල් හාමි මම නුඹගේ
ගීත අසමි දිවි ඇති තුරු"

කුකුල් හාමි:

"රූප සරින් අග තැන්පත්
නුඹේ ගැයුම නැවතුණු විට
බලා හිඳිමි ඉවසිලි නෑ
නැවත ගීය ඇසෙනා තුරු

සුපැහැදිලියි, දයාබරයි
ඒ වගේ ම හරි ඉහළයි
කොහේ සිටන් පහළ විනි ද
නුඹගේ ඔය මුදු කටහඬ?

ඇඟෙන් පතෙන් ලොකුවක් නෑ
ඒ උනාට ගීය නුඹේ
කෝකිල නාදය පරදයි
නුඹෙ පරපුරෙ සැවොම වගේ"

ඇටි කුකුළා:

"ඒ කියුමට තුති පුදමි
අවංකව ම මෙය කියමි
නුඹේ ගැයුම දිව්‍ය ලෝකෙ
පන්සිළු වෙණ නද පරයයි"

මේ කතාව අහගෙන උන්
ගේ කුරුල්ල එතනට විත්
උන් දෙන්නා අමතාලා
මෙවැනි බසක් කීවා.

ගේ කුරුල්ලා:

"නුඹලා දෙන්නා ගුරු-ගුරු ගාමින්
එකිනෙකාගෙ වරුණාව කියෙව්වට
නුඹලා දෙන්නාගෙම ගී සින්දු
ඔක්කොම හරි නරකයි, නරකයි!"

ssssssssssssssssssssssssssssssssss

පව් සිදුවෙන බව නොදන්න ගානට
ඇයි කුකුළගෙ බොරු වරුණෙ කියන්නේ?
ඇටි කුකුළගෙ බොරු වරුණේ කුකුළා
කියන නිසයි ඌ බොරුව ගොතන්නේ

කපුටයි නරියයි



මේ වෙනකොට කී සැරයක්
ලෝකයාට කියා ඇද්ද
චාටු කතා කියනා එක
නරකයි, නොහොබියි කියා?
ඒත් ඉතින් පලක් ඇද්ද?

චාටු කතා කාරයා
අපෙ දුරුවල තැන් බලා
හදි, වින කෙටුමට සැරසී
සිටී මාන බල-බලා

කේප්ජු. කැබැල්ලක් කොහෙන්ද
අහුලා ගත් කළු කපුටෙක්
පියඹා විත් ගසක වසා
ඒක කන්න සැරසුණා

හොටෙන් කේප්ජු කෑල්ල ගෙන
හිත හිත ඉන්නා අතරේ
කපුටාගේ නරක කලට
අහළින් නරියෙක් ගියා

කේජු සුවඳ දැනී
නරිය නතර වුණී
ඇඟිලි තුඩින් පැන පැනා
නරිය ගහට ළං වුණා

වලිගය කර කව-කවා
කපුට දිහා බල-බලා
කේජු ටිකට ලොල් වෙලා
සිටියෙ දෑස් බිම නොලා

රස කවි පද ගොත-ගොතා
තාලෙට ඒවා කියා
කළේ ය නරියා මුලා
ගහේ උන්නු කාකයා

"මනෝහර පරෙවි කුමරෝ
කෙතරම් අගනා ගෙලක් ද
කෙතරම් අගනා දෑස් ද
නුඹට හිමිව ඇත්තේ
ඇත්තම කියනෙම් දැන් මම
නුඹ සුරලොව දූතයෙක් ය
හැබෑ අගේ පියාපත් ය
නාසය කෙතරම් ඔබී ද
එහෙනම් නුඹගේ කටහඬ
කෙතරම් නම් මිහිරි ඇද්ද!

ලැජ්ජා නොමවන් - ගීයක් ගයපන්

නුඹ මෙතරම් ලස්සන නම්
ලස්සන වෙද හඬ කොතරම්!
අප ළඟ නුඹ සිටියා නම්
කුරුළු රජුයි නම් කරනෙම්"

නරියාගේ චාටු කතා - කළා නොවෙද කපුට මුලා
වරුණාවෙන් නරියගෙ ගී - කපුටු සිහිය විකල් වුණී

තාලය අල්ලා - මහ හඬ දීලා
කා කා කියලා - කපුටා ගැයුවා

කේජු පොඩිය බිමට වැටුණි
නරියා එය රැගෙන දුවපි
චාටු කතා ඇසු නරියගෙ
කපුටා බඩගින්නේ තැවුණි

ගෙම්බයි හරකයි

තණ ගාලේ තණ කමින්
සිටි ගවයා දැක උපන්
ගෙම්බගෙ ආඩම්බරෙන්
සිදුවිය විපතක් මෙවන්

හරකෙක් තරමට
මහ ලොකු වෙන්නට
පිම්බී ගන්නට
සිත්විය ගෙම්බට

"ගෙම්බියෙ බලපිය දැන් මම්
මහත නේද හරක තරම්"
කියා ඉරිසියාවෙන් උන්
ගෙම්බා ගෙම්බිට කීවා

"අනේ ගෙම්බො හරක තරම්
මහත් වෙන්න තව කොතරම්
නුඹ ලොකු වෙන්නට ඕනැද?"
කියා ගෙම්බී කීවා

තව පිම්බුණු මේ ගෙම්බා
"දැන් හරිදැයි බලපල්ලා
මහත නේද හරක තරම්"
කියා ගෙම්බිගෙන් ඇසුවා

"තව කොහේද මගෙ ගෙම්බෝ
නුඹ තවමත් පොඩි නොවෙදෝ?
හරක තරම් ලොකු වෙන්නට
ඕනෑ තව පිම්බෙන්නට"

ඒක අහපු මේ ගෙම්බා
තව පිම්බෙන්නට ගත්තා
අන්තිමේදි බැලුමක් මෙන්
'බොහ්' ගා පුපුරා ගියා

අනුන්ට ඉරිසියා කරල
මේ වගෙ අනතුරේ වැටුණු
අය ගැන ඇති උදාහරණ
එකක් නොවේ ඇත්තේ

වීදියෙ සිගමන් යදිනා
දුප්පත් පොඩි යාචකයෙක්
මහ සිටුවරයෙක් වෙන්නට
සිතීම පුදුමයක් නොවෙද?

වැදගැම්මට නැති මිනිහෙක්
මහ වැදගත් හාමු කෙනෙක්
වගේ ජීවිතය ගෙවන්න
සිතීම පුදුමයක් නොවෙද?

වාදකයෝ සිව් දෙනා

වඳුරු අප්පු, එළුවා සමගින්නේ
බූරු නයිදෙ, වලහා එක් වන්නේ
සාජ්ජ පොඩියක් දාමුද කියලා
උන් සිව් දෙන කතිකා කර ගන්නේ

ස්වර රටා ලියු කොල ගෙන එන්නේ
මහ රවිකිඤ්ඤා කරෙනි ගෙනෙන්නේ
පොඩි රවිකිඤ්ඤා තුනක් ම අරගෙන
ගහක් මුල ද උන් හැම එක් වන්නේ

තමන්ගෙ සුරු වාදනයක් දක්වා
මුළු ලොව කුල්මත් කරන්න හිතලා
එකවර හැම දෙන වැයුවා, ගැයුවා
කිසිම දෙයක් කිසි කමකට නැත්තේ

"නවත්තපල්ලා, ඔහොම හිටිල්ලා"
කියලා වඳුරා මහ හඬ දුන්නා
"සංගීතය නම් කෙසේ වැයෙන්නද
නුඹලා ඉඳගෙන සිටිනා විලසට

වලස් හාමි නුඹ මෙහෙට වරෙන්නේ
බූරු නයිදෙ අසලින් ඉඳගන්නේ
එළු රාළත් පෙරටුව හිඳුවාලා
ඒ ගාවින් මා ඇණ බා ගන්නේ

එතකොට අන්තිම සුන්දර ගී නද
පැතිරී ලොව නැලැවෙනු ඇති තාලෙට
වනපෙත් තාලෙට නටන්න වේවී
කඳු පන්තිත් ඒ හා එක්වේවී"

එලෙසට ඉඳගෙන කෙරුවත් වාදන
ඝෝෂාවක් මිස තාල නොමැත්තේ
බූරු නයිදෙ මේ ගැන තේරුම් ගෙන
මැද්දට පැනලා මොර හඬ දෙන්නේ

"නවත්තපල්ලා, මේ අහපල්ලා
සංගීතයෙ මහ රහස් තියෙන්නේ
අපට වැරදුනේ ඒ ගැන නොතකා
තැන් තැන් වල ඉඳ ගැනුමෙ දොසින්නේ

සැවොම වරෙල්ලා - පෙළ සැදියල්ලා
පෙළට ඉඳිල්ලා - වැයුව වයල්ලා"

බූරු නයිදෙගේ ඔවදන් අසලා
මිතුරො හතර දෙන පෙළක් සැදීලා
වාඩි වුණත් වෙණ වැයුමට කියලා
හඬක් නැගුණෙ නැහැ සවන් පිනාලා

කවුරු කොතැන ඉඳගන්නෙද
යනුවෙන් නැඟුණා වාදය
තර්ක කෑලි වචන හරඹ
එතැන හරිම කෝළහලය

කැලේ මැදින් එන ගාලගෝට්ටිය
ඇසුණා අසළින් ගිය කොවුලකු හට
ආවා මොකදැයි විපරම් කෙරුමට
සිදු වූවා උපදෙස් ලැබ දෙන්නට

"ස්වර ලිපි, රවිකිඤ්ඤද - එහෙම ළඟ තියෙනවා
වයන්නට පිරිසක් ද - අප සමඟ සිටිනවා
මෙහොතකට රැඳෙන්නට - අපි අයැද සිටිනවා
වාඩි වෙන්නේ කෙලෙස? - උපදෙසක් පතනවා"

"වෙණ වැයුමට ගී ගැයුමට - පුහුණු ලැබිය යුතුය නිතින
ඒ වෙනුවෙන් නිතර පුහුණු - කළ යුත්තෙ ය ඔබෙ දෙසවන
එහෙම නොකර කොයි කොයි තැන - කවුරුන් සිටියත් ඉඳගෙන
වැයුමත් බැරි, නුවණත් නැති - මෝඩ රැළකි ඔබ සැම දෙන"

වඳුරු රාළ හා ඇස් කණ්නාඩි

වඳුරු රාළ මහලු වුණා
ඇස් පෙනීම හීන වුණා

"ඕකත් ඔය හැටි ලෙඩක් ද?
ඇස් කණ්නඩි බෙහෙත නොවෙද?"
කියා මිනිසුන් කතා වෙන හැටි
වඳුරු රාළට ඇහුණ හොඳ හැටි

දුසිම් බාගයක් කණ්නඩි කුට්ටම්
කොහෙදෝ සිට ඌ ගෙන ආ අන්දම්
බලනු වටිනවා කරනා විගඩම්
අපෙ ඇත්තන්ටත් මේවා පාඩම්

එහෙට හරවයි - මෙහෙට හරවයි
කරකවයි, උඩ පනී, දඟලයි
හිසේ මුදුනට තබා මිරිකයි
වලිග අගට ද තියා විමසයි

විටෙක ඉඹලා බලයි
වරෙක ලෙවකා බලයි
මේ කියනා හැම දෙයක්
කළත් නොවී නිසි පළක්
කණ්නඩියෙන් කිසි වැඩක්
සිදු නොවනා එක දුකක්

"කණ්නඩි ගැන හැම දෙනා
කීවෝ මට බොරු තනා
අබැටක කණ්නඩියෙනා
පිළිසරණක් නැති වුණා

මිනිසුන් කියනා කතා අසන්නා
කාටත් නොදැනිම වලේ වැටෙන්නා"

කෝපයක් ඇති වුණා
හිතේ දුක වැඩි වුණා

කණ්නඩි ගත්තා
ගල උඩ තිබ්බා
ගලෙන් ගැහැව්වා
ඒ කුඩු කෙරුවා

කුඩි වී ගිය කණ්නඩියේ වීදුරු
හිරු එළියට දිලිහෙමින් බැබලුණා

කනගාටුවකට කරුණක් ඇත්තේ
මිනිසුන් අතරත් මේවා ඇත්තේ

කිසියම් දෙයකට හිමි වටිනාකම
නොදන්න අයගෙන් වෙයි නිති වැනසුම

අනුවණ ඇත්තන්ගේ පණ්ඩිත බණ
ඇහුවොත් හැම විට සිදුවන්නේ වින

නුවණැත්තන් පාගා කොන් කර නිති
අනුවණයෝ ගොම රිටි සේ මතු වෙති
කලියුග කාලෙදි මේ දේ වෙයි නිති
විමසිල්ලෙන් සිටියොත් නම් යහපති.

කැකුණ ගහ මුල සිටි ඌරා



සියවස් ගණනක් තිස්සේ පවතින
කැකුණ ගහක් යට මහ අතු විහිදුණ
බඩ පිරෙනා තුරු ගෙඩි කෑ ඉඳගෙන
ඌරා වැටුණා නින්දට නොදැනිම

ඉස්මුරුතෙන් මත් වී සිටි ඌරා
පැය ගණනක් ඒ ලෙස නිදියෑවා
ඉන් පසු අවදිව ඇස් පිසදෑවා
කැකුණ මුලත් හාරන්නට වූවා

හොම්බෙන් ඇන ඇන මුල් සිඳදමනා
ඌරා දුටු කපුටෙක් එහි එන්නා
"මුල් සිඳීම නරකට ම හිටින්නා"
කියලා කපුටා උපදෙස් දුන්නා

"මුල් ළඟ ඇති පස් ටික හෑරුවොතින්
වතුර නැතිව ගස වියලී යාවී
මා කියනා මේ බස නෑසුවොතින්
මතුවට වන්දිත් ගෙවන්න වේවී"

"මේ ගස ඔහෙ වියැලී ගියදෙන්, මට
එය කිසි බියකුදු ගෙන නොම දෙන්නේ
ගසෙන් මෙකී අවැඩක් මිස එලයක්
ලැබෙන බවක් මට නොම තේරෙන්නේ

සියවස් ගණනක් මේ ගස නොවුණා ද
මට නම් ඒ ගැන දුකක් නොමැත්තේ
මේ ගෙඩි තිබුණම මට හොඳට ම ඇති
එහි මදයෙන් නොවැ මා තර වන්නේ"

ඒ මොහොතෙදි මහ හඬක් නැගෙන්නේ
කැකුණ ගසයි මේ කතා කරන්නේ
කළ ගුණ නොදන්න ඌරු නයිදෙටයි
ඒ ගස මේ වග කියන්න වන්නේ

"ඌරු නයිදෙ මෙහෙට වරෙන්
ඇස් ඇරලා උඩ බලපන්
කැකුණ මදේ කෑවා නම්
හැදෙන්නෙ කොහිදැයි බලපන්"

§§

මේ වාගේ වැඩ ලොව සිදු වන්නේ
මෝඩකමින් ඇස් නොපෙනී යන්නේ
ශිල්ප සතර ගණනකට නොගන්නේ
විදුදරයන්ටත් ගැරහුම් එන්නේ

විදුදරයන්ගේ නැණ පහනින් ලද
ආලෝකයෙ එල භුක්ති විඳින්නේ
ඒ බව නොමදන්නා හුදු ජන කැල
විදුදරයන්ට ම දෝස නඟන්නේ

වෘකයා හා බැටළු පැටවා

ශක්තිවන්තයා හමුවේ සැමදා
අහිංසකයටයි වැරදි වැටෙන්නේ
ඉතිහාසයෙ මේ ගැන ලියැවී ඇති
උදාහරණවල අඩුවක් නැත්තේ

අප සැරසෙන්නේ වංශ කතාවේ
තවත් පිටක් හෙම ලියන්න නම් නොව
පුරාණයේ සිදු වෙච්ච කතාවක්
උපදෙස් ලැබ ගනු පිණිස කියන්නයි

ssssssssssssssssssssssssssssssssssssssssssssss

පොතේ ගුරු : ඉර පායා තිබු දවසක - බැටළු පැටිය දිය තිබහට
ආවා දිය කඩිත්ත වෙත - පැන් උගුරක් බීල යන්ට

ඒ වෙලාවෙ කුසගින්නේ - වෘකය ඉව අල්ලන්නේ
කරදරයක් වෙන්න තියෙන - ලකුණු හැමත පළවන්නේ

බැටළුව දුටු වෘක රජා - ඌ ඩැහැ ගන්නට හිතලා
නීතිගරුක බවක් ඊට - ලැබ දෙන්නට බොරු කියලා

වෘකයා : "අපිරිසිදුව ඇති හොම්බෙන් - රොන් මඩ, වැලි අවුස්සලා
මගෙ පිරිසිදු දිය කඩිත්ත - කව්දැයි බොර කරපු එකා

මේ වගෙ නැහැදිච්ච වැඩක් - සිදු වී නැහැ කිසිම කලෙක
හිස සිඳලා දමන තගෙ - මේ සිදු කළ අවමානෙට

බැටළු පැටවා : "වෘක රාළ මේ අහන්න - මට අනුකම්පා කරන්න
දිය බිව්වේ මෙ මා ඔන්න - පියවර සියයක් පහළින

කෝප වන්න නැත කාරිය - නොවිණි මගෙන් අඩුපාඩුව
ඔබතුමාගෙ දිය කඩිත්ත - හැකි වෙද මට කලත්තන්ට?"

වෘකයා : "ඒක නිසයි බොරු කියන්නෙ - නොසන්ඩාලයට බනින්නේ
මේ වගෙ වැඩ අවිනීතනෙ - ඒවට දඬුවමක් ඕනෙ

මතකද බොල බැටළු පැංචො - පහුගිය ගිම්හාන කාලෙ
අපහාසෙට මට කළ කී - දේ අමතක නොවන තාලෙ"

බැටළු පැටවා : "කමා කළ මැනව මහතුනි - නෑදෑයන් කළ වරදට
වරිගයෙ නෑදෑ රොත්තෙන් - කිසිම එලක් නොවී ය මට"

වෘකයා : "ඒ දෙඩුමෙන් කමක් නැතේ - ඌ තගේ සොහොයුරා වෙතේ"

බැටළු පැටවා : "කිසි සොයුරෙක් මට නොමැතේ - එය වැරදීමක් ම වෙතේ"

වෘකයා : "නැතිනම් නුඹෙ ඒ මාමා - ඒ නැතිනම් පොඩි අප්පා
කවුරු වුණත් නුඹගෙ වරිගෙ - නෑදෑ ඇත්තෙක් ම තමා"

නුඹත්, නුඹලගේ බල්ලොත් - එඬේරෝ ද සියලු ම දෙන
මාන බලති කොයි වේලෙත් - මා නැසුමට වින කෙටුමට

හැකියාවක් ලද විගසින් - හතුරුකමක් මට කරන්න
නොපැකිලි වන රැහේ උන්ගෙ - පව් ගෙවන්න දිවි පුදන්න"

බැටළු පැටවා : "මා අත කිසි වරද නැතේ - මා අසරණයෙක් ම වෙතේ
නෑදෑ සනුහරේ නමින් - මා කළ අවැඩක් නොමැතේ"

වෘකයා : "කට වහපන් කරච්චලේ - වරද සොයන එක නුඹගේ !
මට ඇති කාරියක් නොවේ - ඉන් ඉස්පාසුව ද මැකේ

කටමැත දොඩවන තගෙ මා - බොටුව අතට දෙන්නට පෙර
දැනගන් තගෙ එකම වරද - මගෙ බඩගිනි කමක මහත"

පොතේ ගුරු : එවැනි කුරිරු බස් දෙඩලා - වෘකය බැටළුව දක්කා
අඳුරු මූකලානට වැද - නොපෙනී යනු අප දැක්කා

Kanol PRINT

සී/ස ප්‍රගති ප්‍රකාශන නිවස
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08

ISBN 955-1319-00-x
Rs. 150/-